සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமானக் கொள்கை, நிர்வாகம்)
Additional Commissioner General (Revenue Policy & Admin)
2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්
(ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமான முகாமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය. இல.353,கோட்டை வீதி,இராஜகிரிய. *No 353, Kotte Road, Rajagiriya.*

මගේ අංකය / எனது இல. / My No. LB/302.රා. පොදු

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021.12.24

අදාල ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත.

<u>2021/2022 වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කිරීමේදී විකිණීමක් සිදු නොවූ රා තැබෑරුම් සහ විදේශ මත්පැන් තැබෑරුම් ටෙන්ඩර්කරුවන්ට පිරිනැමීම.</u>

වාර්ෂිකව ටෙන්ඩර් මගින් අලෙවි කරන රා තැබෑරුම් සහ විදේශ මත්පැන් තැබෑරුම් කීපයක් ටෙන්ඩර් මගින් අලෙවි කිරීමේදී මා විසින් නියම කරන ලද තක්සේරු මුදලට නැවත ටෙන්ඩර් කිරීමේදීද විකිණීමක් සිදුවී නොමැති බව ඔබ විසින් දන්වා ඇත.

02. මෙවන විට නැවත ටෙන්ඩර් කිරීමද අවසන් බැවින් 2021/2022 වර්ෂය සඳහා ආරම්භ වන රා තැබෑරුම් සහ විදේශ මත්පැන් තැබෑරුම් සඳහා මා විසින් නියම කර ඇති තක්සේරු මුදලින් 35% ක් අඩු කර ටෙන්ඩර්කරුවන් වෙත පිරිනැමීමට අවශ්‍ය අනුමැතිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FP/R/01//03/10/02/06 හා 2021.12.16 දිනැති ලිපිය මගින් ලබාදී ඇත.

03. ඒ අනුව 2021/2022 ආරම්භ වන මෙතෙක් නැවත ටෙන්ඩර් මගින් විකිණීමක් සිදුවී නොමැති රා තැබෑරුම් සහ විදේශ මත්පැන් තැබෑරුම් සඳහා වැඩිම ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරුට මා විසින් තක්සේරු කර ඇති මුදලින් 35% ක් අඩු කර ටෙන්ඩර් පිරිනැමීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

04. තවද තක්සේරු මුදලින් 35% අඩුකළ පසු ලැබෙන මුදලට වඩා ටෙන්ඩර්කරු ඉදිරිපත් කර ඇති මුදල වැඩි නම් ටෙන්ඩර්කරු ඉල්ලා ඇති මුදලට ටෙන්ඩරය පිරිනැමීම සිදු කල යුතුය.

05. එසේම, පළමු ටෙන්ඩර්කරු ටෙන්ඩරය මිලදී ගැනීමට අකමැතිනම් පිළිවෙලින් දෙවන හෝ තෙවන ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය පිරිනැමීමට කටයුතු කරන ලෙසත්, ඔවුන්ද මිලට ගැනීමට අකමැතිනම් ටෙන්ඩර් ඉදිරිපත් නොකල පුද්ගලික ඉල්ලුම්කරුවන් ඉල්ලීම් කරන්නේ නම් ඔහුට අදාල තැබෑරුම පිරිනමන ලෙස දන්වමි.

06. තවද, එම රා තැබෑරුම් සහ විදේශ මත්පැන් තැබෑරුම් මිලදී ගැනීමක් සිදු නොවන්නේ නම් 2021/2022 වර්ෂය සඳහා වසා දැමීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එම්.ජේ.ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත. 01. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කරු.දැ.ග.ස
02. සහකාර සුරාබදු කොමසාරිස්